OL/2010/60-S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**60 | S | I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2010**

| | | |
|---|---|---|
| ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | I, II | පැය තුනයි |
| வணிகக் கல்வியும் கணக்கீடும் | I, II | மூன்று மணித்தியாலம் |
| **Business and Accounting Studies** | **I, II** | *Three hours* |

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුයි :

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති **(1), (2), (3), (4)** යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

---

● පහත සඳහන් ප්‍රකාශය උපයෝගී කර ගනිමින් අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඉපැරණි සමාජයේ පුද්ගල අවශ්‍යතා හා වුවමනා බොහොමයක් තමා විසින් ම නිෂ්පාදනය කර සපුරාගත් බව සඳහන් වේ. එහෙත් වර්තමානයේ පුද්ගල අවශ්‍යතා හා වුවමනා බොහොමයක් වෙළඳපොළෙන් භාණ්ඩ හා සේවා මිලට ගැනීමෙන් සපුරා ගනු ලබයි.

1. වර්තමානයේ වෙළඳපොළෙන් භාණ්ඩ හා සේවා මිලට ගැනීමට හැකි වී ඇත්තේ
   (1) සෘජු නිෂ්පාදනය නිසා ය.
   (2) වක්‍ර නිෂ්පාදනය නිසා ය.
   (3) ප්‍රාථමික නිෂ්පාදනය නිසා ය.
   (4) භාණ්ඩ හුවමාරුව නිසා ය.

2. භාණ්ඩ හා සැසඳීමේදී සේවාවක දැකිය හැකි ගති ලක්ෂණයක් වන්නේ
   (1) ස්පර්ශ කළ හැකි වීම ය.
   (2) ඒකාකාරී වීම ය.
   (3) වෙන් කළ හැකි වීම ය.
   (4) ගබඩා කළ නොහැකි වීම ය.

3. භාණ්ඩ හා සේවා සඳහා මිල ගෙවීමේදී භාවිත කෙරෙන මාධ්‍යය හැඳින්වෙන්නේ
   (1) වටිනාකම ලෙස ය.
   (2) හුවමාරුව ලෙස ය.
   (3) මුදල් ලෙස ය.
   (4) වෙළෙඳාම ලෙස ය.

4. ව්‍යාපාර විකාශනය විවිධ අදියර යටතේ සාකච්ඡා කෙරේ. මෙම විකාශනයේ මුල් ම අදියර හඳුන්වනු ලබන්නේ
   (1) විද්‍යුත් වාණිජ්‍යය ලෙස ය.
   (2) භාණ්ඩ හුවමාරුව ලෙස ය.
   (3) මුදල් භාවිතය ලෙස ය.
   (4) කාර්මික විප්ලවය ලෙස ය.

5. ව්‍යාපාර පරිසරය සූක්ෂම හා සාර්ව වශයෙන් හෝ අභ්‍යන්තර හා බාහිර වශයෙන් හෝ බෙද අධ්‍යයනය කරනු ලැබේ. මෙහි සූක්ෂ්ම පරිසරයට අන්තර්ගත කළ හැකි සාධක **පමණක්** ඇතුළත් කාණ්ඩය තෝරන්න.
   (1) අයිතිකරුවන්, දේශපාලන ප්‍රතිපත්ති, ප්‍රජාව
   (2) ප්‍රජාව, සේවකයින්, ආර්ථික ප්‍රතිපත්ති
   (3) කළමනාකරුවන්, සේවකයින්, තාක්ෂණික වෙනස්වීම්
   (4) අයිතිකරුවන්, කළමනාකරුවන්, සේවකයින්

6. ඕනෑම ව්‍යාපාර සංවිධානයකට පොදු වූ ලක්ෂණය කුමක් ද?
   (1) නීතිමය පුද්ගලභාවය
   (2) සීමිත වගකීම
   (3) අඛණ්ඩ පැවැත්ම
   (4) අරමුණ

[ දෙවැනි පිටුව බලන්න.

7. ව්‍යාපාර සංවිධාන කිහිපයක් පහත දක්වේ.

A. හවුල් ව්‍යාපාර B. සීමිත සමාගම් C. කේවල ස්වාමි ව්‍යාපාර
D. සමුපකාර E. රාජ්‍ය සමාගම් F. දෙපාර්තමේන්තු
G. රාජ්‍ය සංස්ථා

මේවා අතුරෙන් පොදු අංශයට අයත් ව්‍යාපාර සංවිධාන **පමණක්** ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A, D, E (2) B, D, F (3) C, F, G (4) E, F, G

8. මහජනයාට ප්‍රසිද්ධියේ කොටස් නිකුත් කිරීමෙන් ප්‍රාග්ධනය රැස්කරගත හැකි ව්‍යාපාර සංවිධානය වන්නේ

(1) සීමාසහිත පෞද්ගලික සමාගම ය. (2) සීමාසහිත පොදු සමාගම ය.
(3) හවුල් ව්‍යාපාරය ය. (4) ඇපයෙන් සීමිත සමාගම ය.

9. වාණිජ බැංකුවක ජංගම ගිණුම් හිමියෙකුට සිය ගිණුමෙන් ගෙවීම් කිරීමට යොදාගත හැකි විද්‍යුත් මුදල වන්නේ

(1) ණයපත ය. (2) හරපත ය. (3) චෙක්පත ය. (4) අණකරය ය.

10. පහත දක්වෙන්නේ රක්ෂණ ආයතනයක් විසින් පළකරනු ලැබූ ප්‍රචාරණ දැන්වීමක කොටසකි.
"හානියක් සිදුවුවත් නොවුවත් ඔබට රක්ෂණ මුදල් ලබාගත හැකි ය. එහෙත් රක්ෂණ ඔප්පුව පැවරිය නොහැකි ය. රක්ෂණ මුදලට අමතරව ප්‍රසාද දීමනා පොලී වැනි ප්‍රතිලාභ සඳහා ද ඔබට හිමිකමක් ඇත."
මෙම දැන්වීම ඉලක්ක කරනු ලබන රක්ෂණ වර්ගය කුමක් ද?

(1) රථවාහන රක්ෂණය (2) ගිනි රක්ෂණය
(3) මුහුදු උවදුරු රක්ෂණය (4) ජීවිත රක්ෂණය

11. පහත දක්වෙන්නේ සන්නිවේදන මාධ්‍ය කිහිපයක් හා එම මාධ්‍යවල භාවිත කෙරෙන සන්නිවේදන උපකරණ කිහිපයකි.

| සන්නිවේදන මාධ්‍යය | සන්නිවේදන උපකරණ |
|---|---|
| 1. වාචික | A. කෙටි පණිවුඩ සේවාව (SMS) |
| 2. ලිඛිත | B. දැන්වීම් පුවරුව |
| 3. විද්‍යුත් | C. රැස්වීම |

සන්නිවේදන මාධ්‍යවලට අදාළ උපකරණය නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

(1) 1 C, 2 B, 3 A (2) 1 B, 2 A, 3 C (3) 1 C, 2 A, 3 B (4) 1 A, 2 C, 3 B

12. ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් සේවය ලෙස සැලකෙන්නේ

(1) මිහින් ලංකා ගුවන් සේවාව ය. (2) එයාර් ලංකා ගුවන් සේවාව ය.
(3) ශ්‍රී ලංකන් ගුවන් සේවාව ය. (4) ලංකා ගුවන් සේවාව ය.

13. වී ගබඩා කිරීම කෙරෙහි රජය වැඩි අවධානයක් යොමු කිරීමට **ප්‍රධානතම** හේතුව වනුයේ

(1) අත්‍යවශ්‍ය ආහාර භෝගයක් වීම ය. (2) කාලීන නිෂ්පාදනයක් වීම ය.
(3) අනම්‍ය ඉල්ලුමක් පැවතීම ය. (4) පාලන මිලක් තිබීම ය.

14. නිවැරදි අධ්‍යයනයකින් පසුව සකස් කරනු ලබන ව්‍යාපාර සැලැස්මකින් ව්‍යාපාරිකයකුට ලැබිය හැකි ප්‍රයෝජන බොහෝ ය. මේවායින් **වඩාත්** වැදගත් ප්‍රයෝජනය ලෙස සැලකිය හැක්කේ

(1) සැලැස්ම ලිඛිත බැවින් ප්‍රදර්ශනය කළ හැකි වීම ය.
(2) ව්‍යාපාරයෙන් ලැබිය හැකි ප්‍රතිඵලය කුමක් දැයි කල් තබා දැනගත හැකි වීම ය.
(3) ව්‍යාපාරය යා යුතු ගමන් මඟ පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි වීම ය.
(4) ව්‍යාපාරයට අවශ්‍ය සේවකයින් ආකර්ෂණය කරගත හැකි වීම ය.

15. ව්‍යාපාර සැලැස්මෙහි අන්තර්ගත අලෙවි සැලැස්මේ ඇතුළත් කෙරෙන කරුණක් වන්නේ

(1) අපේක්ෂිත නිෂ්පාදන ප්‍රමාණයයි. (2) ලාභාන්තිකයයි.
(3) මූල්‍ය සම්පාදන මාර්ගයි. (4) අපේක්ෂිත විකුණුම් ප්‍රමාණයයි.

16. X සමාගමේ කොටස් 100 ක් එකක් රු. 15.75 බැගින් මිලදී ගත් රවි එම කොටස් සියල්ලම එකක් රු. 20.25 බැගින් විකුණා ලැබූ අමතර රු. 450 ක මුදල හැඳින්වෙන්නේ

(1) ලාභාංශ ලෙස ය. (2) ප්‍රාග්ධන ලාභ ලෙස ය.
(3) පොලී ආදායම ලෙස ය. (4) මුළු ප්‍රතිලාභය ලෙස ය.

17. ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු **ප්‍රධානතම** සාධක දෙක වන්නේ

(1) අවදානම හා ප්‍රතිලාභය ය. (2) අවදානම හා පහසුව ය.
(3) ප්‍රතිලාභය හා ඇප සුරැකුම් ය. (4) පහසුව හා ප්‍රතිලාභය ය.

18. මූල්‍ය සම්පාදන මාර්ගයක් ලෙස සාමාන්‍ය කොටස් නිකුත් කිරීම මගින් ප්‍රාග්ධනය රැස්කර ගැනීමෙන් ව්‍යාපාරයකට ලැබෙන වාසියක් වන්නේ

(1) පිරිවැයක් දැරීමට සිදු නොවීමයි. (2) කළමනාකරණය කෙරෙහි බලපෑමක් ඇති නොවීමයි.
(3) නැවත ඉක්මනින් ගෙවීමක් අවශ්‍ය නොවීමයි. (4) ප්‍රාග්ධන ව්‍යුහයට බලපෑමක් ඇති නොවීමයි.

19. එළවළු, පලතුරු වැනි කෘෂිකාර්මික භෝග බෙදහරින විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පාලනය කරන අමාත්‍යාංශය වනුයේ

(1) කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයයි.
(2) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයයි.
(3) අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යාංශයයි.
(4) සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍යාංශයයි.

20. වර්තමානයේ පවත්නා ඇමරිකානු ඩොලරයක විනිමය අගය ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්න වශයෙන් දක්වෙන පිළිතුර තෝරන්න.

(1) රු. 75 (2) රු. 110 (3) රු. 140 (4) රු. 175

- පහත සඳහන් තොරතුරු උපයෝගී කර ගනිමින් අංක **21** සහ **22** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

2009 මාර්තු 15 දිනට කපිලගේ ව්‍යාපාරයේ තොරතුරු කිහිපයක් පහත දක්වේ.

| | | | |
|---|---|---|---|
| ගොඩනැගිලි | රු. 75 000 | තොගය | රු. 15 000 |
| ණයගැතියෝ | රු. 10 000 | බැංකු ණය | රු. 25 000 |

21. මෙම ව්‍යාපාරයේ ඇති වත්කම් හා වගකීම්වල වටිනාකම නිවැරදිව පිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) රු. 100 000, රු. 25 000 (2) රු. 100 000, රු. 35 000
(3) රු. 90 000, රු. 35 000 (4) රු. 75 000, රු. 50 000

22. කපිලගේ ව්‍යාපාරයේ ප්‍රාග්ධනය වන්නේ

(1) රු. 75 000 කි. (2) රු. 55 000 කි. (3) රු. 45 000 කි. (4) රු. 25 000 කි.

23. කවිඳු තම ව්‍යාපාරය සඳහා රු. 25 000 ක බැංකු ණයක් ලබාගැනීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන කුමක් ද?

(1) මුදල් ගිණුම හර - බැංකු ගිණුම බැර (2) බැංකු ගිණුම හර - ණය ගිණුම බැර
(3) බැංකු ගිණුම හර - ප්‍රාග්ධන ගිණුම බැර (4) මුදල් ගිණුම හර - බැංකු ණය ගිණුම බැර

24. ව්‍යාපාරයකට බඩු තොගයක් ණයට ගැනීමෙන් එම ව්‍යාපාරයේ

(1) වත්කම් හා වගකීම් වැඩි වේ. (2) වත්කම් හා වියදම් වැඩි වේ.
(3) වත්කම් හා ප්‍රාග්ධනය වැඩි වේ. (4) වත්කම් වැඩිවන අතර වගකීම් අඩු වේ.

25. ව්‍යාපාරයක මුදල් පොතේ හර පැත්තේ ගනුදෙනු සටහන් තැබීමට භාවිත කරනු ලබන මූලාශ්‍ර ලේඛනය වන්නේ

(1) ලදුපත ය. (2) හරපත ය. (3) වවුචරය ය. (4) ඉන්වොයිසිය ය.

- සාරා ට්‍රේඩර්ස් හි ඇණවුමක් මත සුමන වෙළඳසැල විසින් පිළියෙල කරන ලද පහත සඳහන් ඉන්වොයිසිය උපයෝගී කර ගනිමින් අංක **26** සිට **28** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඉන්වොයිස් අංකය : 256

2010.11.15
සුමන වෙළඳසැල,
ප්‍රධාන වීදිය,
මීගමුව.

කළමනාකරු,
සාරා ට්‍රේඩර්ස්,
මීගමුව පාර,
කුරණ.

| අනු අංකය | භාණ්ඩ වර්ගය | ප්‍රමාණය | ඒකකයක මිල (රු.) | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| 01 | සබන් - නාමල් | 500 | 20 | 10 000 |
| 02 | දත් බුරුසු - ස්මාර්ට් | 100 | 50 | 5 000 |
| 03 | දන්තාලේප - ෆයින්ගාඩ් | 200 | 40 | 8 000 |
| | | | | 23 000 |
| | 10% වට්ටම | | | 2 300 |
| | | | | 20 700 |

Sumanasiri
කළමනාකරු

26. සාරා ට්‍රේඩර්ස් ඉහත සඳහන් ඉන්වොයිසිය මුලාශ්‍ර ලේඛනයක් ලෙස භාවිත කර මෙම ගනුදෙනුව සටහන් කළ යුතු මූලික සටහන් පොත කුමක් ද?
(1) ගැනුම් පොත (2) විකුණුම් පොත (3) මුදල් පොත (4) ආපසු යැවුම් පොත

27. මෙම ගනුදෙනුව සාරා ට්‍රේඩර්ස්හි ගිණුම් පොත්වල සටහන් කිරීමේදී සුමන වෙළඳසැල ගිණුමට
(1) රු. 23 000 ක් හර කළ යුතු ය. (2) රු. 23 000 ක් බැර කළ යුතු ය.
(3) රු. 20 700 ක් හර කළ යුතු ය. (4) රු. 20 700 ක් බැර කළ යුතු ය.

28. මෙම ඉන්වොයිසියෙහි සඳහන් රු. 2 300 ක වට්ටම
(1) දුන් වට්ටම් ගිණුමට හර කළ යුතු ය. (2) ලැබූ වට්ටම් ගිණුමට බැර කළ යුතු ය.
(3) සුමන වෙළෙඳසැල ගිණුමට හර කළ යුතු ය. (4) ගිණුම් පොත්වල සටහන් කළ යුතු නොවේ.

29. ව්‍යාපාරයක සුළු මුදල් භාරකරු එක්තරා මාසයක් අවසානයේදී රු.650 ක් වියදම් කර තිබූ අතර ඔහු සතුව රු.350ක් ඉතිරි වී තිබුණි. ඉදිරි මාසය සඳහා අදාළ දිනයේදී රු. 650 ක් ප්‍රතිපූරණය කරන ලදී. මෙම ව්‍යාපාරයේ මාසික සුළු මුදල් අග්‍රිමය වන්නේ
(1) රු. 350 කි. (2) රු. 650 කි. (3) රු. 1 000 කි. (4) රු. 1650 කි.

30. ස්ථාවර නියෝග මත බැංකුව විසින් කළ ගෙවීම් ව්‍යාපාරය සටහන් කරනුයේ එහි මුදල් පොතේ
(1) බැංකු තීරුවේ හරට ය. (2) මුදල් තීරුවේ හරට ය.
(3) බැංකු තීරුවේ බැරට ය. (4) මුදල් තීරුවේ බැරට ය.

31. බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී භාවිත කරනු ලබන්නේ
(1) තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් හා බැංකු ගාස්තු පමණි.
(2) තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් හා නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ චෙක්පත් පමණි.
(3) නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ චෙක්පත් හා ස්ථාවර නියෝග මත කළ ගෙවීම් පමණි.
(4) ස්ථාවර නියෝග මත කළ ගෙවීම් හා සෘජු ප්‍රේෂණ පමණි.

- පහත සඳහන් තොරතුරු උපයෝගි කර ගනිමින් අංක **32** සහ **33** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සහන්ගේ ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේ දී එය තුලනය නොවී ය. පසුව පහත සඳහන් වැරදි අනාවරණය විය.

※ වැටුප් ගිණුම රු. 250 ක් අඩුවෙන් එකතු කර තිබීම
※ සුනිල්ට ගෙවූ රු. 450 නිහාල්ගේ ගිණුමේ හරට සටහන් කිරීම

32. වැටුප් ගිණුම රු. 250 ක් අඩුවෙන් එකතු කිරීම නිවැරදි කිරීම සඳහා අදාළ ජ'නල් සටහන තෝරන්න.
(1) වැටුප් ගිණුම හර රු. 250
අවිනිශ්චිත ගිණුම රු. 250
(2) අවිනිශ්චිත ගිණුම හර රු. 250
වැටුප් ගිණුම රු. 250
(3) වැටුප් ගිණුම හර රු. 250
මුදල් ගිණුම රු. 250
(4) වැටුප් ගිණුම හර රු. 250
ගෙවිය යුතු වැටුප් ගිණුම රු. 250

33. සුනිල්ට ගෙවූ රු. 450 නිහාල්ගේ ගිණුමට හර කිරීමෙන් සිදුවී ඇති ගිණුම්කරණ දෝෂය කුමක් ද?
(1) මූලධර්ම දෝෂය (2) අතිරික්තතා දෝෂය (3) ඌනතා දෝෂය (4) හිලව් දෝෂය

- පහත සඳහන් තොරතුරු උපයෝගි කර ගනිමින් අංක **34** සහ **35** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නුවණ පාඨක සමාජය ලාභ නොලබන සංවිධානයක් ලෙස පිහිටුවා ඇති ව්‍යාපාරයකි. මෙහි සාමාජිකයින් 50 ක් සිටින අතර වාර්ෂික සාමාජික ගාස්තුව රු. 100 කි. වර්ෂය අවසානයේ සාමාජිකයින් 10 ක් හැර ඉතිරි සියල්ලම සාමාජික මුදල් ගෙවා ඇත.

34. නුවණ පාඨක සමාජයේ ලැබීම් හා ගෙවීම් ගිණුමේ සාමාජික මුදල් ලැබීම් ලෙස සටහන් කර ඇත්තේ
(1) රු. 1 000 කි. (2) රු. 4 000 කි. (3) රු. 5 000 කි. (4) රු. 6 000 කි.

35. මෙම පාඨක සමාජයේ මේ දක්වා නොලැබී ඇති සාමාජිකයින් 10 දෙනාගේ සාමාජික මුදල් සැලකෙන්නේ
(1) උපචිත වියදම් ලෙස ය. (2) උපචිත ආදායම් ලෙස ය.
(3) පෙර ගෙවුම් ලෙස ය. (4) පෙර ලැබීම් ලෙස ය.

9737

● පහත සඳහන් තොරතුරු උපයෝගී කර ගනිමින් අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සුමුදුගේ ව්‍යාපාරයේ 2010.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත පරිදි විය.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 200 000 |
| 12% බැංකු ණය | | 50 000 |
| ඉඩම් හා ගොඩනැගිලි | 200 000 | |
| තොගය 2009.04.01 දිනට | 16 000 | |
| ගැනුම් | 50 000 | |
| විකුණුම් | | 80 000 |
| ආපසු එවුම් | 2 000 | |
| ආපසු යැවුම් | | 1 500 |
| ණයගැතියෝ | 15 000 | |
| ණයහිමියෝ | | 9 500 |
| රක්ෂණ ගාස්තු | 6 000 | |
| වැටුප් | 15 000 | |
| බැංකු ණය පොලී | 3 500 | |
| ගැනිලි | 2 000 | |
| අතැති මුදල් | 31 500 | |
| | 341 000 | 341 000 |

අමතර තොරතුරු :

* 2010.03.31 දිනට : - තොගය රු. 8 000
  - ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු රු. 1 000
* ණයගැතියන්ගෙන් 5% ක් බොල්ණය ලෙස කපා හැරිය යුතු ය.

36. 2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සුමුදුගේ ව්‍යාපාරයේ විකුණු බඩුවල පිරිවැය
(1) රු. 56 500 කි. (2) රු. 58 000 කි. (3) රු. 64 500 කි. (4) රු. 66 000 කි.

37. 2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම ව්‍යාපාරයේ දළ ලාභය
(1) රු. 13 500 කි. (2) රු. 20 000 කි. (3) රු. 21 500 කි. (4) රු. 23 500 කි.

38. මෙම ව්‍යාපාරයේ 2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරනු ලබන ලාභාලාභ ගිණුමේ බැංකු ණය පොලී ලෙස දක්විය යුත්තේ
(1) රු. 2 500 කි. (2) රු. 3 500 කි. (3) රු. 6 000 කි. (4) රු. 9 500 කි.

39. 2010.03.31 දිනට මෙම ව්‍යාපාරයේ ශේෂ පත්‍රයේ දක්විය යුතු ණයගැතියන්ගේ ශුද්ධ අගය වනුයේ
(1) රු. 14 250 කි. (2) රු. 14 520 කි. (3) රු. 15 000 කි. (4) රු. 15 750 කි.

40. 2010.03.31 දිනට මෙම ව්‍යාපාරයේ ශේෂ පත්‍රයෙහි දක්වෙන මුළු වත්කම්වල එකතුව
(1) රු. 253 750 කි. (2) රු. 254 500 කි. (3) රු. 254 750 කි. (4) රු. 255 500 කි.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**60 S I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
Business and Accounting Studies I, II

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

වැදගත්: උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවල දී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

※ පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න දෙකක් ද, II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද, බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

※ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

**1.** ● පහත සඳහන් සිද්ධිය උපයෝගී කර ගනිමින් අංක **i** සිට **v** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

රසිකා, 'රසහල' නමින් ආහාර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් වසර කිහිපයක් තිස්සේ පවත්වාගෙන යයි. මෙම ව්‍යාපාරයෙහි ආහාරපාන සඳහා ප්‍රමාණවත් ඉල්ලුමක් පවතින අතර තවදුරටත් ව්‍යාපාරය පුළුල් කරගැනීමේ ඉඩ ප්‍රස්ථාවක් පවතී. මෙම ව්‍යාපාරය සඳහා තම යෙහෙළියක වන කුමාරි සම්බන්ධ කර ගැනීමට රසිකා අපේක්ෂා කරයි. කුමාරි ආහාරපාන සැකසීම පිළිබඳ අධ්‍යාපනයක් ලබාගෙන ඇති අතර ආහාරපාන නිෂ්පාදනය කර අලෙවි කරන ප්‍රසිද්ධ ව්‍යාපාර කිහිපයකම සේවය කර පළපුරුද්දක් ද ලබාගෙන සිටියි. ව්‍යාපාරය නවීකරණය කිරීමට අදහස් කරගෙන සිටියද ඒ සඳහා අරමුදල් සම්පාදනය කිරීමට දෙදෙනාටම මේ අවස්ථාවේ හැකියාවක් නොමැත. එබැවින් අවශ්‍ය අරමුදල් බැංකු ණයක් මගින් ලබාගැනීමට අපේක්ෂා කෙරේ.

(i) රසිකා විසින් පවත්වාගෙන යන ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය සඳහන් කර, එම සංවිධාන ක්‍රමයේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

(ii) කුමාරි මෙම ව්‍යාපාරයට බඳවා ගන්නේ නම් වඩා පහසුවෙන් ආරම්භ කළ හැකි යැයි ඔබ යෝජනා කරන ව්‍යාපාර සංවිධානය කුමක් ද? ඔබේ නිගමනයට හේතු **දෙකක්** සඳහන් කරන්න.

(iii) බැංකු ණය ලබා ගැනීමට රසිකාගේ හා කුමාරිගේ ව්‍යාපාරය විසින් සපුරා ගත යුතු අවශ්‍යතා **දෙකක්** සඳහන් කරන්න.

(iv) කුමන වර්ගයේ ව්‍යාපාර සංවිධානයකට ඔවුන් අවතීර්ණ වුවත් ව්‍යාපාරය සාර්ථක කර ගැනීම සඳහා මූලික වශයෙන් පිළියෙල කළ යුත්තේ කුමක් දැයි සඳහන් කර, එහි ඇතුළත් විය යුතු වැදගත් තොරතුරු දක්වන්න.

(v) රසිකාගේ හා කුමාරිගේ ව්‍යාපාරය සාර්ථක වීමට හේතු විය හැකි සාධක මෙම සිද්ධිය ඇසුරෙන් ගෙනහැර දක්වන්න.

● පහත සඳහන් තොරතුරු උපයෝගී කර ගනිමින් අංක **vi** සිට **x** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

2010.10.31 දිනෙන් අවසන් දෙසතිය තුළ ශාන්තගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දක්වේ.

| | | | |
|---|---|---|---|
| ※ ප්‍රාග්ධනය යෙදුවා | රු. 50 000 | ※ ගොඩනැගිල්ලක් මිලදී ගත්තා | රු. 25 000 |
| ※ අත්පිට මුදලට භාණ්ඩ මිලදී ගත්තා | රු. 10 000 | ※ වැටුප් ගෙව්වා | රු. 5 000 |
| ※ මිලදී ගත් සියලුම භාණ්ඩ අත්පිට විකුණුවා | රු. 20 000 | ※ බැංකු ණයක් ගත්තා | රු. 10 000 |

(vi) 2010.10.31 දිනට ශාන්තගේ ව්‍යාපාරයේ මුදල් ශේෂය කොපමණ ද?

(vii) ඉහත ගනුදෙනු සටහන් කිරීම සඳහා භාවිත කළ යුතු මූලික පොත හා ඒ සඳහා යොදගනු ලබන මූලාශ්‍ර ලේඛන සඳහන් කරන්න.

(viii) 2010.10.31 දිනෙන් අවසන් සති දෙක සඳහා මෙම ව්‍යාපාරයේ ශුද්ධ ලාභය කොපමණ ද?

(ix) 2010.10.31 දිනට මෙම ව්‍යාපාරයේ ප්‍රාග්ධනය කොපමණ ද?

(x) 2010.10.31 දිනට මෙම ව්‍යාපාරයේ වත්කම්, ප්‍රාග්ධනය සහ වගකීම් පවතින ආකාරය ගිණුම්කරණ සමීකරණයක් ඇසුරෙන් දක්වන්න.

*(ලකුණු 02 × 10 = 20 යි.)*

[ හත්වැනි පිටුව බලන්න.

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

**2.** (i) ව්‍යාපාර පරිසරය අභ්‍යන්තර හා බාහිර වශයෙන් වර්ග කර අධ්‍යයනය කෙරේ. අභ්‍යන්තර පරිසරය අධ්‍යයනයෙන් ව්‍යාපාර ශක්තීන් හා දුර්වලතා පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි ය. ව්‍යාපාර දෘෂ්ටි කෝණයෙන් ශක්තීන් හා දුර්වලතා සඳහා නිදසුන් දෙක බැගින් දක්වන්න.

(ii) ව්‍යාපාර සංවිධාන, හිමිකාරත්වය හා අරමුණ අනුව වර්ග කෙරේ. මෙම වර්ගීකරණය ගැලීම් සටහන් දෙකක් මගින් ඉදිරිපත් කරන්න.

(iii) පහත සඳහන් ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා බලපත්‍ර නිකුත් කරන ආයතන සඳහන් කරන්න.

(අ) ඉංග්‍රීසි බෙහෙත් අලෙවිසැලක් (ආ) ජාත්‍යන්තර පාසලක්

(iv) වර්තමානයේ ගනුදෙනු සඳහා ණයපත් භාවිතය බොහෝ ජනප්‍රිය වී ඇත. ණයපත් භාවිතයෙන් ණයපත් හිමියාට හා වෙළෙඳසැල් හිමියාට ලැබෙන ප්‍රතිලාභ දෙක බැගින් සඳහන් කරන්න.

(v) විද්‍යුත් ව්‍යාපාර යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? එමගින් පාරිභෝගිකයින්ට ලැබිය හැකි වාසි දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 02 × 5 = 10 යි.)*

**3.** (i) ඔබේ පාසලේ විදුහල්පතිතුමාට පහත සඳහන් පාර්ශ්වයන්ට සන්නිවේදනය කිරීම සඳහා යොදගත හැකි වඩාත් උචිත මාධ්‍යය වෙන වෙන ම ලියා දක්වන්න.

(අ) සිසුන් (ආ) ගුරු මණ්ඩලය

(ඉ) දෙමව්පියන් (ඊ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්

(ii) පහත සඳහන් ද සඳහා පුද්ගලයෙකුට රක්ෂණ අයිතියක් තිබේද නැද්ද යන්න සඳහන් කරන්න.

(අ) තම භාර්යාවගේ හෝ ස්වාමිපුරුෂයාගේ ජීවිතය පිළිබඳ

(ආ) තම දරුවාගේ ජීවිතය පිළිබඳ

(ඉ) තමාගේ උගසට තබා ඇති ස්වර්ණාභරණ පිළිබඳ

(ඊ) කල්බදු ක්‍රමයට ලබා ගත් තම මෝටර් රථය පිළිබඳ

(iii) ජංගම ගිණුමක් හා ඉතිරිකිරීමේ ගිණුමක් අතර ඇති සමාන අසමානතා දක්වන්න.

(iv) අන්තර්ජාතික වෙළෙඳමේදී වඩා භාවිත කෙරෙනුයේ ගුවන් පරිවහනය ද මුහුදු පරිවහනය ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(v) "ව්‍යාපාර සැලැස්මක් නොමැතිව ව්‍යාපාරික කටයුතු කිරීම ඥානාන්විත ක්‍රියාවක් නොවේ." කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 02 × 5 = 10 යි.)*

**4.** (i) රු. 500 000 ක සේවක වන්දි මුදලක් ලබා ගත් සුබෝධා එම මුදල නගරයේ පිහිටි මූල්‍ය ආයතන අතුරෙන් ඉහළම පොලියක් ලබාදෙන 'ස්මාර්ට් කැෂ් සමාගමේ අවුරුදු පහකට ආයෝජනය කිරීමට තිරණය කරයි. අයදුම්පත් ලබාගැනීමට හා මුදල් රැගෙන යාමට ආයතනයේ නිලධාරීන් නිවසට පැමිණීමටත් එයට අදළ සියලු කටයුතු කාර්යක්ෂමව කර දීමටත් එකහ වී ඇත.

(අ) මෙහි සඳහන් වන අන්දමට සුබෝධා තම මුදල් ස්මාර්ට් කැෂ් සමාගමේ ආයෝජනය සඳහා පෙලඹීමට බලපෑ හේතු මොනවා ද?

(ආ) 'සුබෝධාගේ මෙම ආයෝජන තිරණය ඥානාන්විත නොවේ.' පැහැදිලි කරන්න.

(ඉ) සුබෝධාට තම මුදල් ආයෝජනය කළ හැකි වෙනත් විකල්ප ආයෝජන මාර්ග දෙකක් නම් කර, ඒවායෙහි යෝග්‍යතාව සඳහන් කරන්න. *(ලකුණු 02 × 3 = 06 යි.)*

(ii) පහත දක්වෙන මූල්‍ය සම්පාදන මාර්ගවලින් ව්‍යාපාරිකයෙකුට ලැබෙන වාසි හා අවාසි දෙක බැගින් සඳහන් කරන්න.

(අ) බැංකු ණයක් ලබා ගැනීම (ආ) සාමාන්‍ය කොටස් නිකුත් කිරීම *(ලකුණු 02 යි.)*

(iii) ව්‍යාපාරිකයෙකු විසින් මූල්‍ය සම්පාදන මාර්ගයක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු සාධක හතරක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි.)*

*(මුළු ලකුණු 10 යි.)*

II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

**5.** (අ) සූරි පලතුරු මිලදී ගෙන විකිණීමේ ව්‍යාපාරයක් 2010.12.01 දින ආරම්භ කළේ ය. ඔහු මිලදී ගැනීම් හා විකිණීම් අත්පිට මුදලට පමණක් සිදුකරන අතර පළමු දින දෙක තුළ සිදුකරන ලද ගනුදෙනු පහත දක්වේ.

| | | | |
|---|---|---|---|
| 2010.12.01 | ※ ව්‍යාපාරයට මුදල් යෙදවීම | රු. | 25 000 |
| | ※ ලී රාක්කයක් මිලදී ගැනීම | රු. | 5 500 |
| | ※ පලතුරු තොගයක් මිලදී ගැනීම | රු. | 12 000 |
| | ※ ගෙනඒමේ කුලී ගෙවීම | රු. | 750 |
| 2010.12.02 | ※ පලතුරු විකිණීම | රු. | 7 500 |
| | ※ බැංකු ණයක් ලබා ගැනීම | රු. | 10 000 |
| | ※ සේවකයාට වැටුප් ගෙවීම | රු. | 1 000 |
| | ※ සූරි පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් මුදල් ලබා ගැනීම | රු. | 5 000 |

අවශ්‍යවන්නේ :

ඉහත ගනුදෙනු සූරිගේ ව්‍යාපාරයේ මුදල් පොතේ හා අදාළ ලෙජර ගිණුම්වල සටහන් කර 2010.12.02 දිනට මුදල් පොතේ ශේෂය දක්වීම *(ලකුණු 05 යි.)*

(ආ) සයුරිගේ ව්‍යාපාරයේ ගනුදෙනු ගිණුම් පොත්වල සටහන් කිරීමේදී පහත සඳහන් වැරදි සිදු වී ඇති බව අනාවරණය විය.

(i) විකුණුම් පොතේ එකතුව රු. 65 000 විකුණුම් ගිණුමේ රු. 60 000 ක් ලෙස සටහන් කිරීම

(ii) විකිණීම සඳහා මයුරගෙන් ලබාගත් රු. 10 000 ක බඩු තොගය පිළිබඳ කිසිදු සටහනක් නොමැති වීම

(iii) ගෙවූ බැංකු ණය පොලී රු. 1 500, මුදල් පොතේ නිවැරදිව සටහන් කර, බැංකු ණය ගිණුමට හර කර තිබීම

(iv) රු. 2 500 ක රක්ෂණ ගාස්තුව මුදල් පොතේ පමණක් සටහන් කර තිබීම

අවශ්‍යවන්නේ :

(1) ඉහත සඳහන් වැරදි අතුරෙන් ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේදී අනාවරණය නොවන වැරදි දෙක සඳහන් කර ඒවා නිවැරදි කිරීමට අදාළ ජනල් සටහන් දක්වීම *(ලකුණු 03 යි.)*

(2) ශේෂ පිරික්සුම කෙරෙහි බලපාන වැරදි දෙක තුළින් ඇතිවන අවිනිශ්චිත ගිණුමේ ආරම්භක ශේෂය දක්වා එය තුලනය කර පෙන්වීම *(ලකුණු 02 යි.)*

*(මුළු ලකුණු 10 යි.)*

**6.** (අ) ලාභ අරමුණු කර නොගත් සංවිධාන විසින් පිළියෙල කරනු ලබන ලැබීම් හා ගෙවීම් ගිණුම සහ ආදායම් හා වියදම් ගිණුම අතර පවතින වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 02 යි.)*

(ආ) 2010.03.31 දිනෙන් අවසන් වසර තුළ රත්තරු ක්‍රීඩා සමාජයේ ලැබීම් හා ගෙවීම් පහත දක්වේ.

| ලැබීම් : | රු. | ගෙවීම් : | රු. |
|---|---|---|---|
| 2009.04.01 දින ලබාගත් බැංකු ණය | 20 000 | ගෙවල් කුලී | 2 500 |
| සාමාජික මුදල් | 19 500 | ලිපිද්‍රව්‍ය | 1 000 |
| පරිත්‍යාග | 5 000 | පුවත්පත් ගැනුම් | 5 500 |
| පරණ පත්තර විකුණුම් | 1 000 | වැටුප් | 5 000 |
| | | රක්ෂණය | 3 000 |
| | | ක්‍රීඩා භූමි නඩත්තුව | 250 |
| | | සංග්‍රහ වියදම් | 1 500 |
| | | බැංකු ණය පොලී | 750 |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

(i) රත්තරු ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 200 ක් වන අතර වාර්ෂික සාමාජික ගාස්තුව රු. 100 කි.

(ii) උපචිත වැටුප් රු. 3 000 ක් වන අතර රක්ෂණය සඳහා රු. 2 000 ක් ඉදිරියට ගෙවා ඇත.

(iii) වාර්ෂික බැංකු ණය පොලී අනුපාතය 12% කි.

අවශ්‍යවන්නේ :

2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රත්තරු ක්‍රීඩා සමාජයේ ආදායම් හා වියදම් ගිණුම *(ලකුණු 08 යි.)*

*(මුළු ලකුණු 10 යි.)*

[ නවවැනි පිටුව බලන්න.

7. 2010.03.31 දිනට සුනන්දගේ ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත දක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 400 000 |
| බඩු තොගය - 2009.04.01 දිනට | 8 000 | |
| ගැනුම් | 57 000 | |
| විකුණුම් | | 90 000 |
| ණයගැතියෝ | 30 000 | |
| ණයහිමියෝ | | 6 000 |
| 10% බැංකු ණය | | 20 000 |
| ඉඩම් හා ගොඩනැගිලි පිරිවැයට | 250 000 | |
| යන්ත්‍ර පිරිවැයට | 120 000 | |
| ආපසු යැවුම් | | 3 000 |
| ආපසු එවුම් | 2 000 | |
| ලැබූ ගෙවල් කුලී | | 2 000 |
| වරිපනම් | 8 000 | |
| රක්ෂණය | 7 000 | |
| සේවක වේතන | 9 000 | |
| ප්‍රචාරණය | 4 000 | |
| බැංකු ණය පොලී | 1 000 | |
| අතැති මුදල් | 25 000 | |
| | 521 000 | 521 000 |

අමතර තොරතුරු :

(i) 2010.03.31 දිනට බඩු තොගය රු. 18 000 කි.

(ii) යන්ත්‍ර 10% බැගින් සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව ක්ෂය කළ යුතු ය.

(iii) වර්ෂයට අදාළ ගෙවල් කුලිය රු. 6 000 කි.

(iv) ණයගැතියන්ගෙන් රු. 2 500 ක් බොල්ණය ලෙස කපා හැරිය යුතු ය.

අවශ්‍යවන්නේ :

(1) 2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම

(2) 2010.03.31 දිනට ශේෂ පත්‍රය (ලකුණු 10 යි.)

※※※